*සැ. යු.* - 2024.06.07 දින පළ වූ අංක 2388 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,389 - 2024 ජුනි මස 14 වැනි බදාදා - 2024.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 528 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 529 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජුනි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

### විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්ති ප්‍රකාරව බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් හෝ සත්‍යෝක්ෂණයක් කිරීමට 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබාගත යුතු බවට 2023.06.07 දිනැති තීරණ අංක NCP/2023/06/07/209 තීරණය කර ඇත.

1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව නොච්චියාගම බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යෝක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යෝක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

අගෝස්තු මස 14 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

06-84/1

---

## උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

### වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) උපවගන්තියෙන්ම ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නොච්චියාගම බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් තුළ පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියයට පහළවක (15%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. ඩී. ටී. යූ. ධර්මරාණි ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේ ය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
උතුරු මැද පළාත.

අගෝස්තු මස 14 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

06-84/2

**තිහගොඩ ප්‍රාදේශීය සභාව**

විනෝද බද්ද

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2023.11.07 වැනි දින තීරණ අංක 2023/11/07/245 යටතේ ගෙන ඇති පහත තීරණය 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2024 අප්‍රේල් මස 20 වැනි දින,
ගාල්ල ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

**තීරණය**

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තිහගොඩ ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10%ක (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අයකල යුතු යැයි ද, මෙම තීරණය සම්මත *ගැසට්* පත්‍රයේ පළ කරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පලමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද තීරණය කරමි. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස තිහගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, තිහගොඩ ප්‍රාදේශීය සභාව වැඩි දුරටත් තීරණය කරමි.

06-57

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ බදු නිලධාරි II පන්තිය II වන ශ්‍රේණියේ පුරප්පාඩු **04 ක්** සඳහා බඳවා ගැනීමට වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා උසස් කිරීමේ පටිපාටිය ප්‍රකාරව මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන් ම මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2024 අගෝස්තු මස කුරුණෑගල නගරයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

1. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MN 5 - 2016 අනුව,

රු. 34,605 -10 x 660 -11 x 755 -15 x 930 - රු. 63,460 වේ.

2. මෙම තනතුරට අයදුම් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය ඃ

(I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය හා සමාන තත්ත්වයේ ඇති වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පහත සඳහන් වෘත්තීය විභාගයකින් හෝ සමත් වීම.

(අ) වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍යම පරීක්ෂණය :

(ආ) ජාතික උසස් තාක්ෂණ ආයතනයේ (SLIATE) ගණකාධිකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීම ;

(ඇ) පිරිවැය හා කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (ICMA එක්සත් රාජධානිය) 1, 2 හා 3 යන කොටස් සමත් වීම ;

(ඈ) සහතික කළ හා ඒකාබද්ධ ගණකාධිකාරි සංගමයේ (ACCA එක්සත් රාජධානිය) 1, 2 හා 3 යන කොටස් සමත් වීම.

*හෝ*

(III) නීතිඥවරයෙක් වීම.

*හෝ*

(IV) රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවය ස්ථිර කර ඇති වසර 10ක සතුටුදායක සේවා කාලයක් සහිත රාජ්‍ය/ පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන්ට ද මෙම තනතුර සඳහා අයදුම් කළ හැකිය. මේ යටතේ බඳවාගනු ලබන්නේ පවත්නා පුරප්පාඩුවලින් සියයට විසිපහක් (25%) පමණි.

3. *වෙනත් සුදුසුකම් :*

(I) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(II) සෑම අයදුම්කරුවෙක් ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(III) මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරි සහතිකය) මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.

(IV) අයදුම්කරුහට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැති වුව ද කලත්‍රයා හට මෙම පළාතේ අවම වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිය තිබේ නම් එම අයදුම්කරුවන් පිළිබඳව ද සළකා බැලේ. කලත්‍රයාගේ පදිංචි සහතිකය (DS 04 ග්‍රාම නිලධාරි සහතිකය) හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

(V) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඉහත 2 (IV) කොන්දේසිය යටතේ අයදුම්කරනු ලබන අයදුම්කරුවන් හට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(VI) සෑම අපේක්ෂකයෙකු ම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. *සේවා කොන්දේසි :*

4.1 මෙම තනතුර ස්ථිරය. තනතුරට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් විය යුතුය. පත්වීම්ලාභීන් සිය පරිවාස කාලය තුළ රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා

කඩඉම් පරීක්ෂණය සමත් ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 2020.10.16 දිනැති රා.ප.ච. 18/2020 අනුව සේවයට පත් වී වසර 03 ක් ඇතුළත තනතුරට නියම කර ඇති රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

4.4 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ දී ලබා ගත යුතුය.

4.5 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ/ උසස් කිරීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසිවලට අමතරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට යටත් විය යුතුය

5. *බඳවා ගැනීම :*

5.1 බඳවා ගැනීමේ ක්‍රමය :

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

5.2 මෙම ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රතිශතය* |
|---|---|---|---|
| පොදු ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 1/2 | 100 | 40% |

5.3 විෂය නිර්දේශය :

(I) පොදු ප්‍රශ්න පත්‍රය - කාලය පැය 02 යි. (ලකුණු 100 යි)

ශ්‍රී ලංකාවේ ආර්ථික වාණිජ දැනුම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වමින් සාමාන්‍ය දැනුම පිළිබඳව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

(II) අභියෝග්‍යතා ප්‍රශ්න පත්‍රය - කාලය පැය 1 1/2 (ලකුණු 100)

5.4 විභාග පටිපාටිය :

(I) මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් ඉල්ලුම් කළ හැක.

(II) සෑම අපේක්ෂකයෙකු ම ප්‍රශ්න පත්‍ර දෙකට (02) ම පෙනී සිටිය යුතුය.

(III) සෑම අපේක්ෂකයෙකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය විය යුතුය.

(IV) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(V) මෙම විභාගය සමත් වීම සඳහා ඉහත එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40% බැගින් ලබා තිබිය යුතුය.

5.5 සම්මුඛ පරීක්ෂණය :

(I) විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව, පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(II) සම්මුඛ පරීක්ෂණයේ දී අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීම සිදු කරනු ලබන අතර, ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

6. විභාග ගාස්තු :

විභාග ගාස්තු වශයෙන් රු. **1,200/-** ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත, බාගත කරගත් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ව.ප.ස.මු. 02 ආකෘතියේ ලදුපත හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලබන අතර, එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ දෙනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාග යක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

7. අයදුම් කළ යුතු පිළිවෙල :

7.1 (අ) මෙම බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ **psc.nw.gov.lk** දරන වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ. **psc.nw.gov.lk** දරන වෙබ් අඩවියට පිවිස එහි දක්වා ඇති උපදෙස් අනුගමනය කර අයදුම් කිරීම කළ යුතුය. ඊට අමතරව, මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත PDF ගොනුවක් ලෙස බාගත කර එහි මුද්‍රිත පිටපතක් ද යොමු කළ යුතුය.

(ආ) එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් මාර්ගගත අයදුම්පතක් පමණි.

(ඇ) විභාග ගාස්තු ගෙවූ ලදුපත මාර්ගගත අයදුම්පතෙ හි මුද්‍රිත පිටපතේ නියමිත ස්ථානයේ අලවා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව ඔස්සේ ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පත්‍රයෙහි ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

7.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2024.07.08** දින වේ.

7.3 මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත **2024.07.15** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් එවිය යුතුය.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ බදු නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024"** සඳහන් කළ යුතුය.

8. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත තොරතුරු සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද මාර්ගගත අයදුම්පත් හා මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් ඒ බව වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ **0372233769** දුරකථන අංකයට දැනුම් දිය යුතුයි.

9. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම තම අනන්‍යතාවය පහත සඳහන් ලියවිලිවලින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

*සටහන* : විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සළකනු ලැබේ.

10. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම බඳවා ගැනීමේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වීමට පෙර හෝ පැවැත්වෙන අතරතුර හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. කිසියම් පත්වීම්ලාභියෙකු සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට හැකිවේ.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

12. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඊ. එම්. පී. ඒකනායක,<br>
ලේකම්,<br>
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 මැයි මස 29 වැනි දින,<br>
පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
කුරුණෑගල.

06-85

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.